සැ. යු. -මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2004 වර්ෂයේ අප්‍රේල් - ජූනි කාර්තුවලට අදාල පොත් නාමාවලිය සහ VI කොටසේ වෛද්‍ය, දන්ත වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය වෘත්තිකයින්ගේ නාම ලේඛනයක් වෙන් වෙන්ව ඉංග්‍රිසි භාෂාවෙන් පළවේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,547 - 2008 අප්‍රේල් මස 25 වැනි සිකුරාදා - 2008.04.25**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 362 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — | නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| | | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 මැයි මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 අප්‍රේල් මස 18 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාවයි

ණය අංකය : 2/19207/පී2/402.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.11.27 වැනි දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. කඩවත පදිංචිව සිටි ජයලාල් දිසානායක යන අයට, 17.5% වාර්ෂික පොලී අනුපාතයක් මත අවුරුදු විස්ස (20) කින් ආපසු ගෙවිය යුතු රු. 1,80,000 ක ණය මුදලක් පදිංචිය සඳහා නිවසක් මිලදී ගැනීම සඳහා ප්‍රදානය කරන ලද බැවින් ද,

2. එකී ජයලාල් දිසානායක යන අය 2001.02.25 වැනි දින මියගිය බැවින් කොළඹ දිසා අධිකරණයේ නඩු අංක සී. ජී. 5458 යටතේ 2005.10.11 දිනැති නියෝගය මගින් මියගිය ජයලාල් දිසානායක යන අයගේ බූදලය නියෝජනය කිරීම සඳහා ඔහුගේ භාර්යාව වන කේ. එල්. පී. රමණී දිසානායක යන අය පත් කර ඇති බැවින් ද,

3. ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ජේ. බී. තන්තිරිමුදලි විසින් 1989.02.02 දින සහතික කරන ලද අංක 16285 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම එකී කේ. එල්. පී. රමණී දිසානායක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2007.11.25 දිනට මුල් ණය මුදල හා එය මත පොලී වශයෙන් රුපියල් තුන්ලක්ෂ පනස් එක්දහස් අටසිය හැත්තෑ එකයි ශත තුන (රු. 3,51,871.03)ක මුදලක් ද, එදින සිට පූර්වෝක්ත බැඳුම්කර අංක 16285 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හැත්තෑ හතරයි ශත විසිහය (රු. 74.26) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩුයිච්හි බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, දැන් ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ මහර දිස්ත්‍රික් සංවර්ධන සභා සීමාව තුළ ඉහළ කරගහමුණ පිහිටියාවූ ද, බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් සැකසුනු 1975.01.07 දින හා අංක 1373 දරන එහෙත් අංක 1375 දරන ඔප්පුව අනුව පිඹුරු අංක 1375 පිඹුරේ දක්වා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 19.5 වූ ද දියපරගහදෙණිය හෙවත් ගිඩපරගහවත්ත හෙවත් මිල්ලගහවත්ත (ඔප්පුවට අනුව දියපරගහදෙණිය හෙවත් ගොඩපරගහවත්ත) දැනට භාවිතා කරන සිම්පෝනියාවත්ත නමැති ඉඩමේ කැබලි අංක 74 නම් වූ ද දේපළ හා පරිශ්‍රය පූර්වෝක්ත පිඹුරු අංක 1373හි දක්වා ඇති කැබලි අංක ආර් 1 හා ආර්. 12 මාර්ග රක්ෂිත හරහා මාර්ග අයිතිය සමඟ වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

04-703/4

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාවයි

ණය අංකය : ජීපී/02/1420/ජීඑන්1/119.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.05.03 වැනි දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. එම්. ඩී. ජයතිලක විසින් සහතික කරන ලද 2002.07.23 දින හා අංක 1261 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම දිවුලපිටිය පදිංචි කච්චකඩුගේ අචලා ඩොරින් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.03.31 දිනට මුල් ණය මුදල හා එය මත පොලී වශයෙන් රුපියල් එක්ලක්ෂ හාරදහස් නවසිය හතලිහයි ශත පනස්එක (රු. 1,04,940.51)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1261 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් තිස්තුනයි ශත හතලිස් හතර (රු. 33.44) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩුයිච්හි බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ, මාබෝදල උප කාර්යාල සීමාවේ, මාබෝදල හොරගස්මුල්ල මහහේන වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. එම්. ඩී. ටී. පී. රෙජිනෝල්ඩ් විසින් 2002.01.22 දින මැන සාදන ලද අංක 459-2-කේ දරන මිනුම් පිඹුරේ කැබලි අංක 28 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 15ක් වූ බෙදා වෙන් කල බිම් කොටස නිවස සහ ඒ මත පිහිටි සියළු දේත් සමග වේ.

තව ද, එකී අංක 459-2-කේ දරන පිඹුරේ අංක 33, 34 (මීටර් 6ක් පළල මාර්ග අයිතිය ද) කැබලි අංක 35,36, 37 සහ 38 මතින් ඇති (අඩි 12ක් පළල මාර්ග අයිතිය ද) ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

04-703/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුනු යෝජනාවයි

ණය අංකය : ජීපී/02/1755/ජීඑන්1/257.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2007.09.27 වැනි දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. කේ. එන්. ප්‍රියංගනී විතාන විසින් සහතික කරන ලද 2003.09.15 දින හා අංක 5340 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම පස්යාල පදිංචි ගමරාලලාගේ මහින්ද කුමාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2007.08.25 දිනට මුල් ණය මුදල හා එය මත පොලී වශයෙන් රුපියල් දෙලක්ෂ විසිදහස් අටසිය දහනවයයි ශත තිස්එක (රු. 2,20,819.31)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 5340 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අනූතුනයි ශත හැත්තෑ හත (රු. 93.77) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල හා 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව්හි බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමාවේ මක්කනිගොඩ ගමෙහි පිහිටි කැන්දලන්ද වත්ත හෙවත් ගල්පොල්ලියද්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. එම්. එච්. නවරත්න විසින් 1998.10.02 දින සකසන ලද අංක 12882ඒ දරන මිණුම් පිඹුරේ කැබලි අංක 03 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 28.44ක් වූ බෙදා වෙන් කළ බිම් කොටසේ නිවස සහ ඒ මත පිහිටි සියළු දේත් සමග වේ.

තව ද, කැබලි අංක 7 මතින් හිමි (අඩි 12ක් පළල පාර සඳහා වෙන් කරන ලද) මාර්ග අයිතිය සහ පිඹුරු අංක 12882ඒ දරන පිඹුරේ දැක්වෙන අනෙකුත් අයිතීන් ද සමඟ වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

04-703/1

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාවයි

ණය අංකය : 57899/ජේ2/674.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2007.11.27 වැනි දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. වත්තල පදිංචි වේලාතන්ත්‍රිගේ තිලකතිස්ස බොතේජු යන අයට, 22% වාර්ෂික පොලී අනුපාතයක් මත අවුරුදු දහයකින් (10) ක ආපසු ගෙවිය යුතු රු. 8,00,000 ක ණය මුදලක් නිවසක් සහිත ඉඩමක් මිලදී ගැනීම සඳහා ප්‍රදානය කරන ලද බැවින් ද,

2. එකී වේලාතන්ත්‍රිගේ තිලකතිස්ස බොතේජු යන අය 1999.01.31 වැනි දින මියගිය අතර කොළඹ දිසා අධිකරණ නඩු අංක සී. ජී. 5244 යටතේ 2007.08.23 දිනැති නියෝගය මගින් මියගිය වේලාතන්ත්‍රිගේ තිලකතිස්ස බෝතේජු යන අයගේ බූදලය නියෝජනය කිරීම සඳහා කොළඹ දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා පත් කර ඇති බැවින් ද,

3. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. යූ. ආර්. වණිගසේකර විසින් සහතික කරන ලද 1995.11.16 දින හා අංක 1188 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම එකී කොළඹ දිස්ත්‍රික් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් පැහැර හැර ඇති බැවින් ද, 2007.10.05 දිනට මුල් ණය මුදල හා එය මත පොලී වශයෙන් රුපියල් විසිදෙලක්ෂ හතලිස්දහස් හාරසිය පනස් දෙකයි ශත හය (රු. 2,240,452.06)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1188 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හාරසිය හැත්තෑ පහයි ශත හැත්තෑ නවය (රු. 475.79) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධිත සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර,

නුගේගොඩ, පාගොඩ පාර, අංක 03හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, දැන් ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ හැඳල පොකුණ පාරේ වරිපනම් අංක 39/3 දරන පිහිඹියාගහ වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සැකසුණු 1985.03.16 දින හා අංක 1832 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 8 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 12.5ක් වූ බෙදා වෙන් කළ මුල් බිම් කොටස වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

04-703/3

---

### මහජන බැංකුව

#### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007 ජූලි මස 27 වැනි දින පවත්වන්නට යෙදුනු මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත පරිදි වූ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව නමට, නුවරඑළිය මහජන නොතාරිස් ජයමිණි අඹගහවත්ත විසින් ලියා සහතික කරන ලද අංක 379 හා 2005 දෙසැම්බර් මස 30 වැනි දින ද අංක 453 හා 2006 ජූලි මස 07 වැනි දින ද දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මුදලිගේ ශ්‍යාමලී වික්‍රමසිංහ සහ හේවාරත්නගේ ඩේවිඩ් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී උකස් බැඳුම්කර මත දැනට රුපියල් විසිතුන් ලක්ෂ හතලිස් හය දහස් අටසිය විසිහයකුත් ශත තිස් හයක (රු. 23,46,826.36) මුදලක් සහ රුපියල් හාරලක්ෂ හැටහතර දහසක (රු. 4,64,000) මුදලක් මහජන බැංකුවට ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් විසිතුන් ලක්ෂ හතලිස් හයදහස් අටසිය විසි හයකුත් ශත තිස් හයක (රු. 23,46,826.36) ක මුදල සහ රුපියල් හාරලක්ෂ හැටහතර දහසක (රු. 4,64,000) මුදල හා එම මුදල් ප්‍රමාණ සඳහා පිළිවෙලින් 2007.02.09 දින සිට විකිණීමේ දින දක්වා සහ 2007.02.26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වර්ෂයකට 16.5% බැගින් පොළිය ද යන මේ මුදල් ප්‍රමාණ අතරින් යම් මුදලක් මේ වන විට ගෙවා ඇත්නම්, ඒ මුදල අඩුකොට ඉහත සඳහන් මුදල් ප්‍රමාණ සහ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද සමග අයකර ගැනීම සඳහා එකී අංක 379 හා 453 දරන උකස් බැඳුම්කර මගින් එම බැංකුව වෙත උකස් කර තිබෙන දේපළ හා පරිශ්‍රය, බලයලත් වෙන්දේසිකාර කැස්බෑව, වලව්වත්තේ, ඒ. එස්. ලියනගේ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත පරිදි වූ 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### උකස් කරන ලද දේපළ විස්තරය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ, රම්බොඩ කෝරළේ, කුඩාඔය ග්‍රාමයේ පිහිටි බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : ඇල් රිසවේසම ද, නැගෙනහිරට : ඇලේ රිසවේසම ද, දකුණට: එච්. කේ. හින්නි අප්පු හිමිකම් කියන ඉඩම ද බස්නාහිරට : වී. ජී. චාර්ලිස් සිංඤෝ හිමිකම් කියන ඉඩම ද, යන මායිම් ඇතුළත රූඩ් තුනක් (අ. 0. රූ. 3, පර්. 0) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි හා වෙනත් සියලු දේ.

මෙම ඉඩම පසුව මනින ලදුව පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ, රම්බොඩ කෝරළේ, කුඩාඔය ග්‍රාමයේ පිහිටි බෙදා වෙන් කළ බිම් කට්ටියක් වන, බලයලත් මිනින්දෝරු බී. එම්. එස්. බී. කරුණාරත්න විසින් මැන සාදන ලද අංක ඒ 3583 හා 1996.10.19 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් ඒ ලෙස ලකුණු කළ බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම් උතුරට : ඇලේ රිසවේසම සහ අඩි පාර ද, නැගෙනහිරට : එච්. කේ. හීන්අප්පු හිමිකම් කියන ඉඩම ද, දකුණට : ඇලේ රිසවේසම ද, බස්නාහිරට : වී. ජී. එස්. සිංඤෝ හිමිකම් කියන ඉඩම ද යන මායිම් ඇතුළත එම පිඹුර ප්‍රකාර රූඩ් තුනකුත් පර්චස් හතයි දශම හතක් (අ. 0, රූ. 3, පර්. 7.7) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම නුවරඑළිය ඉඩම් ලියාපදංචි කිරීමේ කාර්යාලයේ කේ 08/152/2005 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
නුවරඑළිය.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 40, උද්‍යාන පාර,
නුවරඑළිය.

04-620

---

### මහජන බැංකුව — මරදගහමුල ශාඛාව

#### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ සම්මත කරගනු ලැබූ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.07.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2004.12.28 දිනැති අංක 9766 සහ 2005.11.12 දිනැති

අංක 10591 දරන උකස්කර ප්‍රකාර ගෙවීම්, පොන්සුගේ මහින්ද සුදර්ශන අනුරුද්ධ තිසේරා යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ පන්දහස් තුන්සිය විසිහයයි ශත හතලිස් පහ (රු. 2,05,326.45) සහ රුපියල් අනූතුන්දහස් හාරසියය (රු. 93,400)ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2006.06.18 දින සිට වර්ෂයකට 18.25% බැගින් රුපියල් දෙලක්ෂ පන්දහස් තුන්සිය විසිහයයි ශත හතලිස් පහ (රු. 2,05,326.45) සහ 2006.05.29 දින සිට වර්ෂයකට 20.5% බැගින් රුපියල් අනූතුන්දහස් හාරසියය (රු. 93,400)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ පන්දහස් තුන්සිය විසිහයයි ශත හතලිස් පහ (රු. 2,05,326.45) සහ රුපියල් අනූතුන්දහස් හාරසියය (රු. 93,400)ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 9766 සහ 10591 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ, දාසිය පතත්තුවේ. දිවුලපිටිය පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. විතාරණ විසින් 2002.06.04 සහ 1999.08.10 වැනි දිනවල මැන සකස් කල අංක 4226 දරන පිඹුරේ (2003.07.16 දින බලයලත් මානක එච්. එල්. සී. දබරේරා විසින් නැවත මැන සකස් කර ඇත) ලොට් අංක 5බී දරන කොටසට මායිම්, උතුරට : ලොට් 5ඒ ද, නැගෙනහිරට : ලොට් 8 (මාර්ගය) ද, දකුණට : මීගමුව-මීරිගම ප්‍රධාන මාර්ගය ද, බස්නාහිරට: ලොට් 7 යන මායිම් තුල පිහිටි පර්චස් එකොලහයි දශම නමයයි අට (අ. 0, රු. 0, පර්. 11.98) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 297/225හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන් කර ඇති ලොට් 8හි මාර්ග අයිතිය ද සමග වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 317/71හි ලියා පදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කලාප III.

මහජන බැංකුව,
බටහිර III කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

04-621

### මහජන බැංකුව-නුගේගොඩ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.02.29 වැනි දින පැවැත්වූ පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් චන්ද්‍රිමා ඉඳුරුව මහත්මිය විසින් සහතික කරන ලද 2004.03.18 දිනැති අංක 1565 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම, ඕවිටිගල හේවගේ දෝන විමලාවතී මිය, හෙට්ටිආරච්චිගේ කැලුම් හර්ෂප්‍රිය මයා, හෙට්ටිආරච්චිගේ බුද්ධික ලසන්ත මයා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් දසලක්ෂයක් (රු. 10,00,000) හා හයලක්ෂයක් හා ශත දහහතරක (රු. 6,00,000.14) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, පිළිවෙලින් 2007.06.01 දින හා 2007.09.25 දින සිට වර්ෂයකට සියයට දහනවයයි දශම දෙකයි පහ බැගින් (19.25%) පොළිය අයවිය යුතුය. වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ “29එල්” (29L) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දසලක්ෂයක් (රු. 10,00,000) හා හයලක්ෂයක් හා ශත දහහතරකක් (රු. 6,00,000.14) අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 1565 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ ගංගොඩවිල, පැඟිරිවත්ත පාරේ පිහිටි "ගොරකගහලන්ද" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එම්. සමරසිංහ මහතා විසින් 1960.08.28 දින මැන සාදන ලද අංක 648 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන්කල ලොට් අංක බී දරන කොටසට මායිම් උතුරට : ලොට් ඒ ද, නැගෙනහිරට : ලොට් සී ද, දකුණට : ලොට් 9 ද, බස්නාහිරට : ඩී. ඒ. රූබසිංහ මහතාගේ අංක 179 දරන පිඹුරේ ලොට් 4 ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විසිපහයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 25.75) විශාල ඉඩම සහ එහි තුල පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියළු දේද වේ.

තවද පහත සඳහන් මාර්ග අයිතිවාසිකමද සමග වේ.:

ඉහත කී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ ගංගොඩවිල පැඟිරිවත්ත පාරේ පිහිටි. එකී “ගොරකගහලන්ද” නමැති ඉඩමෙන් එකී අංක 648 දරන පිඹුරේ පරිදි පාරක් වශයෙන් බෙදා වෙන් කළ ලොට් “සී” දරන කොටසට මායිම්, උතුරට : ලොට් ඒ ද, නැගෙනහිරට: ලොට් අංක 179 දරන පිඹුරේ ලොට් 7 ද, දකුණට : ලොට් 9 ද, බස්නාහිරට: ලොට් අංක 3 යන මෙකී මායිම් තුළ වූ පර්චස් හතරයි දශම හතයි හයක් (අ. 0, රූ. 0, පර්. 4.76) විශාල බිම් තීරය පොදුවේ පාරක් වශයෙන් පරිහරණය කිරීමේ අයිතිවාසිකම ද වේ.

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2537/148, 2536/154 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කලාප II.

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ (පිටත),
මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

04-622

---

## මහජන බැංකුව - කඩුවෙල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.10.20 වැනි දින පැවැත්වූ පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩබ්. අමරසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 1994.01.21 දිනැති අංක 2615 හා 1995.07.21 දිනැති අංක 3547 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, පන්නිල මොහොට්ටාලලාගේ අබේවර්ධන මයා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හතලිස්නව දහස් තුන්සිය විසිදෙකයි ශත දහහතක් (රු. 49,322.17) සහ රුපියල් හතලිස් අටදහස් තුන්සිය විසිපහයි ශත අනූහතරක් (රු. 48,325.94) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 1998.12.23 දින සිට වර්ෂයකට සියයට විසිහතක (27%) බැගින් රුපියල් හතලිස්නවදහස් තුන්සිය විසිදෙකයි ශත දහහතක් (රු. 49,322.17) සහ 1998.07.31 දින සිට වර්ෂයකට සියයට විසිහතරක (24%) බැගින් රුපියල් හතලිස් අටදහස් තුන්සිය විසිපහයි ශත අනූහතරක (රු. 48,325.94) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හතලිස් නවදහස් තුන්සිය විසිදෙකයි ශත දහහතක මුදල (රු. 49,322.17) හා රුපියල් හතලිස්අටදහස් තුන්සිය විසි පහයි ශත අනූහතරක (රු. 48,325.94) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 2615 හා 3547 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ සංවර්ධන සභාව අංක 10 දරන කඩුවෙල, ඒකකය තුළ, ඉහළ බෝමිරියේ යන ගම පිහිටි පැලැන්ගහ ලන්ද හෙවත් හැඩවකගහ වත්ත නම් ඉඩමේ යූ. එන්. පී. විජේවීර බලයලත් මිනින්දෝරු මහතා විසින් 1981.12.29 දින මැන සකස් කළ අංක 288 දරන පිඹුරෙහි ලොට් අංක 21 දරන කැබැල්ලට මායිම්, උතුරට අංක 22 දරන කැබැල්ල ද, නැගෙනහිරට වික්‍රමආරච්චි විසින් හිමිකම් කියන ඉඩම ද, දකුණට අංක 20 දරන කැබැල්ල ද, මායිම් වූ පර්චස් දහසයක් විශාල (අ. 0, රූ. 0, පර්. 16) ඉඩම ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 829/189හි ලියාපදිංචිව ඇත්තා වූ ද, ජේ. පී. විජේසේකර වරලත් මිනින්දෝරු මහතා විසින් 1990.06.03 දින මැන සකස් කළ අංක 312 දරන පිඹුර ප්‍රකාර මෙසේ සඳහන් වේ.

පැලැන්ගහලන්ද හෙවත් ඇටඹගහවත්ත නම් ඉඩමේ අංක 1 දරන කැබැල්ලය කියන ඉඩමේ උතුරට : යූ. එන්. පී. විජේවීර මානක තැනගේ 1981.12.29 දිනැති හා අංක 288 දරන පිඹුර ප්‍රකාර අංක 22 දරන කැබැල්ල ද, නැගෙනහිරට : වික්‍රමාරච්චි විසින් හිමිකම් කියන කුඹුර ද, දකුණට යූ. එන්. පී. විජේවීර මානක තැනගේ 1981.12.29 දිනැති අංක 288 දරන පිඹුර ප්‍රකාර අංක 20 දරන කැබැල්ල ද, බස්නාහිරට පාර (අඩි 20 පළල) මායිම් වූ පර්චස් දහසයක් විශාල ඉඩම. (අ. 0, රූ. 0, පර්. 16) ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලුම දේද වේ.

ඉහත කී ඉහළ බෝමිරිය යන ගම පිහිටි ඉහත කී ඉඩමේ, ඉහත සඳහන් අංක 288 දරන පිඹුර ප්‍රකාර පාරක් සඳහා වෙන් කළ අංක 103 දරන කැබැල්ලට මායිම්, උතුරට අංක 49, 48, 47,46, 45, 38, 37, 36, 35, 34, 33, 32, 31, 29, 28, 81 සිට 87 දක්වා වූ කැබලි ද, 99 සිට 102 දක්වා ද 72 සිට 78 දක්වා වූ කැබලි ද, නැගෙනහිරට : අංක 17 සිට 28 දක්වා, 89 සිට 91 දක්වා සහ 50 සිට 53 දක්වා වූ කැබලි ද, දකුණට අංක 1 සිට 15 දක්වා 53 සිට 63 දක්වා, 92 සිට 98 දක්වා, 90, 61, 99 සිට 102 දක්වා වූ කැබලි ද, බස්නාහිරට : රක්ෂපාන පාර ද, අංක 40 සිට 44 දක්වා 64, 67, 68, 66, 69 සහ 102 දරන කැබලි ද, මායිම් වූ අක්කර දෙකකුත් රූඩ් දෙකකුත් පර්චස් දහනවයයි දශම හයක් විශාල (අ. 2, රූ. 2, පර්. 19.6) බිම් තීරය පාරක් වශයෙන් පාවිච්චි කිරීමේ අයිතිය ද වේ.

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 829/189, 788/256හි ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාප II).

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ (පිටත), මහජන බැංකුව,
අංක 177, හයිලෙවල් පාර,
නුගේගොඩ.

04-623

---

## පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - බම්බලපිටිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.02.27 වැනි දින පවත්වන ලද රැස්වීමකදී පහත සඳහන් පරිදි විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් යෝජනා සම්මත කර ගන්නා ලදී.

ලොකුගේ තිලක් කපිල ද සිල්වා සහ කොඩිසිංහ ආරච්චිගේ ලක්ෂ්මන් රූපසිංහ, කලින් පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුන, ලියාපදිංචි අංක පීකිව් 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ලියන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොළවත්තගේ විසින් සහතික කරන ලද අංක 1586 සහ 2005 මාර්තු මස 9 වැනි දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද, එකී උකස්කරය මත දැන් මුල් මුදල වශයෙන් සහ 2007 මැයි මස 30 වැනි දින දක්වා නොගෙවූ පොළිය වශයෙන්, රුපියල් පන් මිලියන එක්ලක්ෂ හැට හතර දහස් එකසිය හතලිස් හයයි ශත හතලිස් හතක් (රු. 51,64,146.47) සහ රුපියල් සිව් මිලියන එක් ලක්ෂ හාර දහස් හත්සිය අසූ නවයයි ශත හැටතුනක (රු. 41,04,789.63) මුදල මත, 2007 මැයි මස 31 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 24% බැගින් පොළිය (මෙහි මින්පසු සමහරවිට පීඒබීසී බැංකුව යනුවෙන් හැඳින්වෙන) පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

දැන් මෙයින් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ :-

එකී අංක 1586 දරන උකස්කරය මත ලැබිය යුතු එකී පන් මිලියන එක් ලක්ෂ හැට හතර දහස් එකසිය හතලිස් හයයි ශත හතලිස් හතක (රු. 51,64,146.47) මුදල සහ 2007 මැයි මස 31 වැනි දින සිට විකිණීමේ දින දක්වා පොළිය ද, ගාස්තු ද එකී 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද පීඒබීසී බැංකුවට උකස්කර ඇත්තා වූ ද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට, නුවර ටොරින්ටන් පාරේ, අංක 24 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරුවන් වන මෙසර්ස් ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස,

**ඉහත සඳහන් උපලේඛනය**

1. දැන් හොරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය ඇතුළත පිහිටියාවූ ද, බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, මුංවත්තබාගේ පත්තුවේ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළ අරකාගොඩ පිහිටි (බලයලත් මිනින්දෝරු තැන්පත් එම්. පී. පියසිරි විසින් සාදන ලද අංක 3592 සහ 1999.06.13 දින දරන සැලැස්මේ නිරූපිත අංක පී. පී. ක/800 දරන ඉදිගහවෙලදෙනිය හෙවත් අරකගොඩදෙනිය සීමා නිර්ණය කළ කොටසක් වන ඉඩමේ යළි මැනීමක් සහ අනු බෙදීමක් වන්නාවූ) බලයලත් මිනින්දෝරු තැන්පත් ඊ. ටී. ගුණවර්ධන විසින් සාදන ලද අංක 2410 සහ 2002.11.23 වැනි දින දරන මිනින්දෝරු සැලැස්මේ නිරූපිත අංක 1 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති එම සම්පූර්ණ බිම් කොටස අංක 2410 දරන සැලැස්ම අනුව, එකී අංක 1 බිම් කැබැල්ලට මායිම් උතුරට අංක 339 දරන සැලැස්මේ දැක්වෙන එම ඉඩමේම අංක 1බී බිම් කැබැල්ල, නැගෙනහිරට මැන්දිරිස් සහ අනිකුත් අයගේ ගොඩෝවිට කුඹුර, දකුණට කේ. මුනිස්ගේ සහ අනිකුත් අයගේ හුණු කිරිල්ලගහදෙනිය සහ අංක 2410 දරන සැලැස්මේ නිරූපිත එම ඉඩමේම අංක 2, 4 සහ 3 බිම් කැබලි සහ බස්නාහිරට කේ. චාලෝ සිංඤෝ්ට සහ අනිකුත් අයට අයත් එම ඉඩමේම කොටසක් වන 1ඒ බිම් කැබැල්ල සහ එහි ප්‍රමාණය අක්කර හතරයි රූඩ් තුනයි පර්චස් විසි අටයි දශම හත (අ. 4, රූ. 3, පර්. 28.7)වේ.

2. දැන් හොරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය ඇතුළත පිහිටියාවූ බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ, මුංවත්තබාගේ පත්තුවේ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත අරකාගොඩ පිහිටි (බලයලත් මිනින්දෝරු තැන්පත් එම්. පී. පියසිරි විසින් සාදන ලද අංක 3592 සහ 1999.06.13 දින දරන සැලැස්මේ නිරූපිත අංක පී. පී. ක/800 දරන අරකාගොඩදෙණිය හෙවත් ඉදිගහවෙල දෙනියේ සීමා නිර්ණය කර ඇති කොටසක් යනුවෙන් හැඳින්වෙන ඉඩමේ යළි මැනීමක් සහ අනු බෙදීමක් වන්නාවූ) බලයලත් මිනින්දෝරු තැන්පත් ඊ. ටී. ගුණවර්ධන විසින් සාදන ලද අංක 2410 සහ 2002.11.23 වැනි දින දරන මිනින්දෝරු සැලැස්මේ නිරූපිත අංක 2 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති එම් සම්පූර්ණ ඉඩම එකී අංක 2410 දරන සැලැස්ම අනුව, එකී අංක 2 බිම් කැබැල්ලට මායිම්, උතුරට : මැන්දිරිස්ගේ සහ අනිකුත් අයගේ ගොඩෝවිට කුඹුර සහ අංක 2410 දරන සැලැස්මේ නිරූපිත අංක 1 සහ 4 දරන බිම් කැබැලි, නැගෙනහිරට අංක 2410 දරන එකී සැලැස්මේ අංක 3 සහ 4 බිම් කැබලි සහ ගෝනදූව සිට මිල්ලනියට වැටී ඇති පාර, දකුණට ගෝනදූව සිට මිල්ලනයට වැටී ඇති පාර සහ බස්නාහිරට : අංක 1 බිම් කැබැල්ල සහ මුනිස්ට සහ අනිකුත් අයට අයත් හුණු කිරිල්ලගහදෙණිය සහ එහි ප්‍රමාණය අක්කර එකයි, රූඩ් දෙකයි පර්චස් විසි එකයි දශම දෙකයි (අ. 1, රූ. 2, පර්. 21.2) වේ.

3. දැන් හොරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය ඇතුළත වන්නා වූ, බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරලේ, මුංවත්තබාගේ පත්තුවේ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය සභා සීමා ඇතුළත අරකාගොඩ පිහිටි (බලයලත් මිනින්දෝරු තැන්පත් එම්. පී. පියසිරි විසින් සාදන ලද අංක 3592 සහ 1999.06.13 දින දරන සැලැස්මේ ද නිරූපිත අංක පී. පී. ක/800 දරන අරකාගොඩදෙනිය හෙවත් ඉදිගොල්ලදෙනියේ සීමා නිර්ණය කර ඇති කොටසක් යනුවෙන් හැඳින්වෙන ඉඩමේ යළි මැනීමක් සහ අනු බෙදීමක් වන්නාවූ) බලයලත් මිනින්දෝරු තැන්පත් ඊ. ටී. ගුණවර්ධන විසින් සාදන ලද අංක 2410 සහ 2002.11.23 වැනි දින දරන මිනින්දෝරු සැලැස්මේ නිරූපිත අංක 4 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති එම සම්පූර්ණ බිම් කොටස අංක 2410 දරන සැලැස්ම අනුව, එකී අංක 4 බිම් කැබැල්ලට මායිම් උතුරට : මැන්දිරිස්ගේ සහ අනිකුත් අයගේ ගොඩෝවිට කුඹුර සහ අංක 2410 දරන සැලැස්මේ නිරූපිත එම ඉඩමේම අංක 1 බිම් කැබැල්ල, නැගෙනහිරට : ඇල, දකුණට : අංක 2410 දරන සැලැස්මේ දැක්වෙන එම ඉඩමේම අංක 2 සහ 3 බිම් කැබැලි සහ බස්නාහිරට : අංක 2410 දරන සැලැස්මේ දැක්වෙන එම ඉඩමේම අංක 1 සහ 2 බිම් කැබලි සහ එහි ප්‍රමාණය රූඩ් එකයි පර්චස් විසි එකයි දශම දෙකයි (අ. 0, රූ. 1, පර්. 21.2) වේ.

4. බස්නාහිර පළාතේ, දැන් හොරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය ඇතුළත කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ (බටහිර) මුංවත්තබාගේ පත්තුවේ (බටහිර) අරකාගොඩ පිහිටි (සර්වේ ජනරාල් විසින් සාදන ලද අංක පී. පී. ක/800 1974 අප්‍රේල් සහ මැයි දරන සැලැස්මේ නිරූපිත ඉඩමේ කොටසක් වන) බලයලත් මිනින්දෝරු වයි. කරුණාරත්න කොස්තා විසින් සාදන ලද අංක 339 සහ 1985.01.05 වැනි දින දරන සැලැස්මේ නිරූපිත අරකාගොඩදෙනිය හෙවත් ඉදිගොල්ලදෙනිය අංක 1සී බිම් කැබැල්ලේ කොටසක් ලෙස හැඳින්වෙන බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති බිම් කොටස එහි පිහිටි ගහකොළ වැවිලි සහ සියල්ල සහිතවයි අංක 339 දරන සැලැස්ම අනුව එකී ඉඩමට මායිම්, ඊසානට : බටදොඹගහඹිවිට කුඹුරු, ගිණිකොට : ගොඩඹිවිට කුඹුර සහ එම ඉඩමේම කොටසක් නිරිතට : එම ඉඩමේම කොටසක්, වයඹට : එම ඉඩමේම කොටසක් සහ අංක පී. පී. ක/800 දරන සැලැස්මේ 1බී බිම් කැබැල්ල සහ එහි ප්‍රමාණය අක්කර එකයි රූඩ් දෙකක් (අ. 1, රූ. 2, පර්. 0) වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිත් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු-අයකර ගැනීම්.

04-714

### මහජන බැංකුව - මිද්දෙණිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.12.17 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. ඩී. කුමුදිනී මිය විසින් සහතික කරන ලද 2006.12.15 දිනැති අංක 2108 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, දර්ශනී ප්‍රියංගිකා වික්‍රමරත්න සහ දොන් අන්ද්‍රයස් වික්‍රමරත්න යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් ලක්ෂ දහයක (රු. 10,00,000) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2007.07.18 දින සිට වර්ෂයකට 21% බැගින් රුපියල් ලක්ෂ දහයක (රු. 10,00,000) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් ලක්ෂ දහයක (රු. 10,00,000) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් ඉහත කී අංක 2108 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තිරණය කරයි.

#### උකස් කර ඇති දේපළ විස්තරය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, උතුරු ගිරුවා පත්තුවේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මුරුංගගස්යාය නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ, මුරුංගගස්යාය ගමේ (අවසාන ගම් පිඹුරු අංක 401) පිහිටි හම්/7/ප්‍ර/53444 ඔප්පුවේ උපලේඛනයෙහි විස්තර වන බලයලත් මිනින්දෝරු ඒ. වී. පී. එස්. පණ්ඩිතසේකර මහතාගේ 2006.12.14 වැනි දින සම්පාදිත අංක 061204 දරන පිඹුරෙහි ඒ අක්ෂරය ලෙස පෙන්වා ඇති ඉඩමට එම පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : අබේසිංහ කංකානම්ගේ ගිමාරහාමි හිමිකම් කියන අවසාන ගම් පිඹුරු අංක 401හි අංක 415 දරන කැබැල්ල ද, නැගෙනහිරට : මීගස්ආර සිට මිද්දෙණිය, හුංගම දක්වා වූ ප්‍රධාන පාරට වෙන් කරනලද මාර්ග රක්ෂිතය ද, දකුණට : ඩබ්. ඒ. කේ. කරෝලිස් අයිතිවාසිකම් කියන අවසාන ගම් පිඹුරු අංක 401හි අංක 420 දරන කැබැල්ල ද, බස්නාහිරට : පී. ඒ. ජිනදාස අයිතිවාසිකම් කියනු ලබන අවසාන ගම් පිඹුරු අංක 401හි අංක 417 දරන කැබැල්ල ද යන සතර මායිම් තුළ පිහිටි අක්කර එකයි රූඩ් බින්දුවයි පර්චස් බිංදුවක් (අ. 1, රූ. 0, පර්. 0) විශාල ඉඩම සහ එය තුළ පිහිටි වැවිලි සහ ගොඩනැගිලි යනාදී සියලු දෙයද වේ. මෙය තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක හම්/7/ප්‍ර/53444හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
හම්බන්තොට.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 7ඒ, ටවර්හිල් මාවත,
හම්බන්තොට.

04-619

### මහජන බැංකුව - පේදුරුතුඩුව ශාඛාව - 285

වර්ෂ 1986 අංක 32 දරන මහජන බැංකු ආඥාපනතේ 29ඩී වගන්තිය මගින් සංශෝධනය කරනු ලැබූ වර්ෂ 1961 මහජන බැංකු ආඥාපනතේ 29 පරිච්ඡේදයේ අංක 29 වගන්තිය සම්බන්ධයෙන් කරනු ලබන තීරණය.

වර්ෂ 1986 අංක 32 දරන ආඥාපනත මගින් සංශෝධනය කරනු ලැබූ වර්ෂ 1961 අංක 29 පරිච්ඡේදයේ 29ඩී වගන්තිය අනුව මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.11.23 දින පවත්වන ලද රැස්වීමේදී පහත දක්වා ඇති තීරණය ඒකමතිකව අනුමත කරගත් බැව් මෙමගින් දන්වනු ලැබේ.

කරවෙඩ්ඩි තුන්නාලෙයි කන්දසාමි දේවාලය විදියෙහි පදිංචි මාණික්කම් ක්‍රිෂ්ණරාජා සහ මේනකෙයි ක්‍රිෂ්ණරාජ යන දෙදෙනා අංක 4280 හා 2004.03.17 දින දරන යාපනයේ ප්‍රසිද්ධ නොතාරිස් ලිංගා දුරෙයිරාජා විසින් මහජන බැංකුවට වාසිදායකව සහතික කරන ලද උකස්කරයේ සඳහන් රුපියල් තුන්ලක්ෂ අටදාස් හයසිය දහයක මුදල (රු. 3,08,610) ආපසු ගෙවීමේ කාර්යය කඩකර ඇති නිසා දැනට මහජන බැංකුවට එකී මුදල ආපසු ගෙවීමට ණයගැතිව සිටිති.

මේ අනුව මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පවරන ලද වර්ෂ 1986 අංක 32 සංශෝධන ආඥාපනතේ 1961 අංක 29 වගන්තියේ විධිවිධාන අනුව අංක 4280 උකස්කරය යටතේ උකස් තබන ලද දේපළ හා ඉඩම අවසරලත් වෙන්දේසිකාර කාර්තිගේසු පොන්නයියා බාලක්‍රිෂ්ණන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකුණා එකී මුදල වන රුපියල් තුන්ලක්ෂ අටදාස් හයසිය දහය (රු. 3,08,610) සහ එකී රුපියල් තුන්ලක්ෂ අටදාස් හයසිය දහයක (රු. 3,08,610) මුදල සඳහා 2006.03.28 දින සිට දේපළ හා ඉඩම විකුණන දින දක්වා වූ සියයට 15.75% බැගින් වූ වාර්ෂික පොලිය ද, වැයද අනෙකුත් වියදම් ද සහ මෙකී ණය මුදල සඳහා ආපසු ලැබූ යම් ගෙවීම් ඇත්නම් ඒවා අඩුකර ඉතිරි මුදල් සියල්ල පියවා ගැනීමට තීරණය කර ඇත.

#### උකස් කරන ලද දේපළ හා ඉඩමේ විස්තර සටහන

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වඩමරාඩ්චි ප්‍රදේශ කඩ්ඩෙයිවෙළි පැරිෂියේ කුන්නාලෙයිසෙගට්තොඩ්දේවා කුරිච්චියේ පිහිටි පරුත්තියෝලෙයි නමැති ඉඩම බිම් ප්‍රමාණය ලාච්චම් 01හි (වී. සී.) සහ කුළි 14.64 මෙය අංක 1461 හා 1987.02.14 දින දරන අවසරලත් මිනින්දෝරු සී. අලගස්යා මයාගේ මැනුම් සැලැස්ම අනුව අංක 01 දරන බිම් කොටස ලෙස දක්වා ඇති අතර මෙයට නිවසක් සහ එහි ඇති සියලු උපාංගයන් හිමිවේ.

මෙකී ලාච්චම් 01 (වී. සී.) සහ කුළි 14.64 ඉඩමේ මායිම් මෙලෙස වේ.

නැගෙනහිරින් : පරමසෝදි රවිගේ ඉඩම, උතුරින් : පටු මගකින්, බටහිරින් : කුමාරසාමි කෝකිලවානිගේ ඉඩම, දකුණ : සිවකුමාර් පුෂ්පලතාගේ ඉඩම

මෙකී විස්තර සියල්ලම පේදුරුතුඩුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඒ 418/40 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ලයේ අණ පරිදි.

සහකාර සාමාන්‍යාධිකාරී,
උතුරු කලාපය.

04-624

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකු විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට බදුල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. හෙන්නායක මැණිකේ විසින් ලියා සහතික කරන ලද අංක 1567 හා 2006 ඔක්තෝබර් මස 09 දින දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම සේරා පුඩ් සෙන්ටර් ඇන්ඩ් කමියුනිකේෂන් යන නාමය අභිධානය සහ ආයතනය යටතේ ව්‍යාපාරය කරගෙන යන දොන් අජිත සේරසිංහ සහ රාජපක්ෂ මුදියන්සේලාගේ ශ්‍යාමලී රාජපක්ෂ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2007 ජූලි මස 31 වැනි දිනට ඉහත කී අංක 1567 දරන උකස් බැඳුම්කරය මත එකී දොන් අජිත සේරසිංහ සහ රාජපක්ෂ මුදියන්සේලාගේ ශ්‍යාමලී රාජපක්ෂ යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හත්ලක්ෂ හතලිස් පන්දහස් පන්සිය අසූවකුත් ශත අසූහතරක (රු. 7,45,580.84) මුදලක් සහ 2007 අගෝස්තු 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් හයලක්ෂ අසූනව දහස් හයසිය අසූහතරකුත් ශත හැට හයක් (රු. 6,89,684.66) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රේල් 1, ජූලි 1, ඔක්තෝබර් 1 යන දිනවලදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් වන ආසන්නතම ඉහළ 0.5 ට තීන්දු කරන අනුපාතිකයන් මත පොළිය ද, ලැබිය යුතුව හා අයවිය යුතු හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හත්ලක්ෂ හතලිස් පන්දහස් පන්සිය අසූවකුත් ශත අසූහතරක (රු. 7,45,580.84) මුදල සහ 2007 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හයලක්ෂ අසූනව දහස් හයසිය අසූහතරකුත් ශත හැට හයක (රු. 6,89,684.66) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි මස 1, අප්‍රේල් මස 1, ජූලි මස 1 සහ ඔක්තෝබර් මස 1 යන දිනවලදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් වන ආසන්නතම ඉහළ 0.5ට තීන්දු කරන අනුපාතිකයන් මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී 1567 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් හා සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

#### අංක 1567 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකිඳ කොට්ඨාශයේ උඩපළාත කෝරළේ, නුගතලාව ග්‍රාමයේ පිහිටි වැවදිගේ අස්වනාතේවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 1711 හා 1987 මාර්තු 3 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට මහ පාර ද. නැගෙනහිරට : ජේ. කේ. පියසේන හිමිකම් කියන ඉඩම ද, දකුණට ඇල සහ බස්නාහිරට : ඩී. ගමගේ හිමිකම් කියන ඉඩම ද යන මායිම් ඇතුළත පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

ඩී. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.

04-677/1

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ගිණුම් අංකය : 1970000722.
ණය ගිණුම් අංකය : 217159.

2007 දෙසැම්බර් මස 27 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂිතව සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. ඇස්. විජේසේකර විසින් සහතික කරන ලද්දාවූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂිතව සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. ඇස්. විජේසේකර විසින් සහතික කරන ලද්දාවූ ද, කොමර්ෂල් බැන්ක ඔෆ් සිලෝන් ලිමිටඩ්හි නමට ලියන ලද්දා වූ ද, 2004 නොවැම්බර් මස 04 වැනි දින හා අංක 1636 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලොකු කන්කානම්ගේ ප්‍රදීප් අමේන්ද්‍ර පීරිස් ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එකොළොස් ලක්ෂ අනූ දෙදහස් අටසිය විසිතුනයි ශත පනස් හතක (රු. 11,92,823.57) මුදලක් 2007 ජුනි මස 04 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එකොළොස් ලක්ෂ අනූ දෙදහස් අටසිය විසිතුනයි ශත පනස් හතක (රු. 11,92,823.57) මුදලක්

2007 ජුනි මස 05 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 9,80,764.14ක මුදල මත 20%ක වැඩිදුර වාර්ෂික පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1636 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කොට ඇත්තා වූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ හා පරිශ්‍රය, කොළඹ 12, හල්ස්ඩෝර්ෆ් වීදියේ අංක 99හි බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### ඉහත කී උපලේඛනය

බලයලත් මානක සී. ද ඇස් ගිණිගේ විසින් 1935 ජුලි මස 24 වැනි දින සාදන ලද අංක 295ඒ දරන පිඹුරේ පෙන්වා ඇති ගාල්ල දිසා අධිකරණයේ අංක 33965 දරන නඩුවේ වාර්තා ගතවී ඇති පිටියෙවත්ත හෙවත් මහගෙදරවත්ත ඉඩමේ දොලහෙන් එක් කොටසින් (1/12) තුනෙන් එක් කොටසක් (1/3) වන ගහකොළ, භූමිය ඇතුළු සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් බී දරන ඉඩම දැනට බලයලත් මානක ටී. බී. ද. එස්. සිල්වා විසින් වර්ෂ 2003 දෙසැම්බර් මස 27 වැනි දින සාදන ලද අංක 7243 දරන පිඹුර පරිදි, දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩපත්තුවේ, අම්බලංගොඩ නගර සභා සීමාව තුළ සහ අම්බලංගොඩ පටබන්ඩිමුල්ල පිහිටි ගොඩනැගිලි, වගාවන් සහ සියළු දේත් සමග වූ නගර සභාවන් ද කොට්ඨාශ අංක 2හි මහ වීදියේ, අම්බලංගොඩ නගර සභා වරිපනම් අංක 366 දරන කඩ කාමරය සමග වෙන් කරන ලද ඒකාබද්ධ ලොට් බී1, බී2, සී11, සී21, සී31, සී32 සහ ඩී දරන ඉඩම් කොටස් වන අතර එකී ලොට් බී1, බී2, සී11, සී21, සී31, සී32 සහ ඩී දරන කොටස්වලට මායිම් උතුරට අංක 295 දරන පිඹුරේ පෙන්වා ඇති එකී ඉඩමේ ලොට් ඒ සහ අඩි පාර ද, නැගෙනහිරට : අඩි පාර සහ එම ඉඩමේ කොටසක් ද, දකුණට : එම ඉඩමේ කොටසක් සහ මහ වීදිය ද, සහ බස්නාහිරට එම ඉඩමේ ලොට් ඒ 295 දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි සහ මහ විදිය ද, යන මායිම් තුළ අංක 7243 දරන පිඹුර පරිදි පර්චස් නවයයි දශම තුනයි බිංදුවයි දෙක (අ. 0, රූ. 0, පර්. 9.302)ක් විශාල ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ240/190 වෙළුමේ පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

04-699

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට බදුල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. එච්. මැණිකේ මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 1251 හා 2006 මැයි මස 23 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම බණ්ඩාරවෙල ජ්ලෝරා යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන පට්ටියගෙදර, ජේම්ස් ගල්ගේවෙල යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2007 ඔක්තෝබර් මස 31 වැනි දිනට ඉහත කී අංක 1251 දරන උකස් බැඳුම්කරය මත ඉහත කී පට්ටියගෙදර, ජේම්ස් ගල්ගේවෙල යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හත්ලක්ෂ හාරදහස් තුන්සිය දහසයක (රු. 7,04,316) මුදලක් සහ 2007 නොවැම්බර් මස 1 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හයලක්ෂ පනස් දහස් හාරසිය අසූඅටක් (රු. 6,50,488) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රේල් 1, ජූලි 1, සහ ඔක්තෝබර් 1 යන දිනවලදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයටය (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හයක් (6%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකයක් මත පොලිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හත්ලක්ෂ හාරදහස් තුන්සිය දහසයක (රු. 7,04,316) මුදලක් සහ 2007 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හයලක්ෂ පනස් දහස් හාරසිය අසූඅටක් (රු. 6,50,488) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රේල් 1, ජූලි 1, සහ ඔක්තෝබර් 1 යන දිනවලදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හයක් (6%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකයක් මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්තිවලට අනුකූලව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1251 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 1251 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මහපළාත කෝරළේ, කොන්තහෙළ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ, කොන්තහෙළ (එෆ්. වී. පී. 76) ග්‍රාමයේ පිහිටි බිම් කට්ටියට මායිම්, උතුරට පල්ලෙවෙල මහ පාර ද, නැගෙනහිරට ඊ. එස්. වී. මද්දිලියට අයිති ඉඩම ද, දකුණට : ඊ. එස්. වී. විල්සන්ට අයිති ඉඩම ද, බස්නාහිරට ඊ. එස්. සොබනාට අයිති ඉඩම ද යන මායිම් ඇතුළත අක්කර එකක් (අ. 1, රූ. 0, පර්. 0) විශාලත්වය ඇති ඉඩම.

බලයලත් මිනින්දෝරු එච්. එම්. හේරත් විසින් මැනදී සාදන ලද අංක 801 හා 1999.07.15 දින දරන පිඹුරෙහි මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහ පළාත කෝරළේ, කොන්තහෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කොන්තහෙල (එෆ්. වී. පී. 76 ඌව) ග්‍රාමයේ පිහිටි පනන්ගල පතන නමැති ඉඩමේ ඉහත කී අංක 801 දරන පිඹුරේ ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : පල්ලේවෙල-බණ්ඩාරවෙල මහ පාර සහ රිසවේසම ද, නැගෙනහිරට : ඊ. එස්. වී. මද්දිලියට සහ ඊ. එස්. වී. විල්සන්ට අයිති ඉඩම් ද, දකුණට : ඊ. එස්. වී. විල්සන්ට අයිති ඉඩම ද සහ එකී පිඹුරේ ලොට් අංක 2 ද බස්නාහිරට : (දැනට) ඊ. එස්. වී. නන්දේරිස්ට අයිති ඉඩම ද යන මායිම් ඇතුළත අක්කර එකක් (අ. 1, රූ. 0, පර්. 0) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ

මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.

04-677/3

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු බැබූ යෝජනා සම්මතිය.

ගිණුම් අංක : 1970000722.
ණය ගිණුම් අංකය : 263073.

2007 දෙසැම්බර් මස 27 වන දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනා විශේෂිතව සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස්, අයි. ඇස්. විජේසේකර විසින් සහතික කරන ලද්දා වූද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූද, 2005 ක්වූ ඔක්තෝබර් මස 09 වන දින හා අංක 2033 දරණ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලොකු කන්කානම්ගේ ප්‍රදීප් අමෙන්ද්‍ර පීරිස් හා ගීතා දර්ශනී කෝරළගේ ණයකරුවන් හැටියටද, ලොකු කන්කානම්ගේ ප්‍රදීප් අමේන්ද පීරිස් උකස්කරු හැටියටද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හත්ලක්ෂ නවදහස් දෙසිය පනස් තුනයි ශත පනස් හතරක් (රු. 709,253.54) මුදලක් 2007 ජූනි මස 04 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හත්ලක්ෂ නවදහස් දෙසිය පනස්තුනයි ශත පනස් හතරක (රු. 709,253.54) මුදලට 2007 ජූනි මස 05 වන දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රු. 594,123.69 ක මුදල මත 20%ක වැඩි දුර වාර්ෂික පොලියද ප්‍රචාරක වියදම් සඳහා දරණ ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදලක් අඩුකොට එකී අංක 2033 දරණ බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛණයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූද, දේපල සහ පරිශ්‍රය, කොළඹ 12, හල්ස්ඩෝප් වීදියේ අංක 99 හි බලයලත් වෙදේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්‍ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බලයලත් මානක සී. ද ඇස්. ගිණිගේ විසින් 1935 ක්වූ ජූලි මස 24 වන දින සාදන ලද අංක 295ඒ දරණ පිඹුරේ පෙන්වා ඇති ගාල්ල දිසා අධිකරණයේ අංක 33965 දරණ නඩුවේ වාර්තා ගතවී ඇති පිටියෙවත්ත හෙවත් මහගෙදරවත්ත ඉඩමේ දොලහෙන් එක් කොටසින් (1/12) තුනෙන් එක් කොටසක් වන (3/1) ගසකොල භූමිය ඇතුලු සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් බී දරණ ඉඩමට දැනට, බලයලත් මානක ටී. බී. එස් ද සිල්වා විසින් වර්ෂ 2003 දෙසැම්බර් මස 27 වන දින සාදන ලද අංක 7243 දරණ පිඹුර පරිදි දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබොඩපත්තුවේ, අම්බලන්ගොඩ නගර සභා සීමාව තුල සහ අම්බලන්ගොඩ පටබන්ඩිමුල්ල පිහිටි ගොඩනැගිලි වගාවන් සහ සියළුදේත් සමග වූ නගර සභා ඡන්ද කොට්ඨාශ අංක 2හි මහ වීදියේ, අම්බලන්ගොඩ නගර සභා වරිපනම් අංක 366, දරණ කඩ කාමරය සමග වෙන් කර ලද ඒකාබද්ද ලොට් බී 1, බී 2, සී 11, සී 21, සී 31, සී 32, සහ ඩී දරණ ඉඩම් කොටස් වන අතර, එකී ලොට් බී 1, බී 2, සී 11, සී 21, සී 31, සී 32, සහ ඩී දරණ කොටස් වලට මායිම් :- උතුරට අංක 295 දරණ පිඹුරේ පෙන්වා ඇති එකී ඉඩමේ ලොට් ඒ සහ අඩි පාර ද, නැගෙනහිරට : අඩි පාර සහ එම ඉඩමේ කොටසක්ද, දකුණට : එම ඉඩමේ කොටසක් සහ මහ වීදිය ද, සහ බස්නාහිරට : එම ඉඩමේ ඒ අංක 295 දරණ පිඹුරේ පෙන්වා ඇති වීදියද යන මායිම් තුළ අංක 7243 දරණ පිඹුර පරිදි පර්චස් නවයයි දශම තුනයි බිංදුවයි දෙක (අ. 0 රූ.0 පර්. 9.302) ක් විශාල ඉඩම බලපිටිය ඉඩම් ලියාපදංචි කිරීමේ කාර්යාලයේ ඒ 240/190 වෙළුමේ පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර් දුනුවිල මහත්මිය
සමාගම් ලේකම්.

04- 700

---

## ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකු විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. එන්. ඒ. කුරේරා විසින් ලියා සහතික කරන ලද අංක 2075 හා 2005 පෙබරවාරි මස 24 වැනි දින ද, අංක 2076 හා 2005 පෙබරවාරි මස 24 දින ද දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම "නිමල්සිරි මෝටර් ස්ටෝර්ස් " යන නාමය අභිධානය සහ ආයතනය යටතේ අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන ගලෙන්බිඳුණුවැව, කිරිබණ්ඩාගේ නිමල් විජේතිලක යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2007 අගෝස්තු මස 31 වැනි දිනට ඉහත කී අංක 2075 හා 2076 දරන උකස් බැඳුම්කර මත එකී කිරිබණ්ඩාගේ නිමල් විජේතිලක යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හත්ලක්ෂ අසූ අටදහස් පන්සිය හැත්තෑවකුත් ශත විසිපහක (රු. 7,88,570.25) මුදලක් ද, සහ 2007 සැප්තැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හයලක්ෂ හත්දහස් හත්සිය හතලිස් අටක් (රු. 6,07,748) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි මස 01, අප්‍රේල් මස 01, ජූලි මස 01 සහ ඔක්තෝබර් මස 01 යන දිනවලදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනමක් මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලි අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හත්ලක්ෂ අසූඅටදහස් පන්සිය හැත්තෑවකුත් ශත විසිපහක (රු. 7,88,570.25) මුදල සහ 2007 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හයලක්ෂ හත්දහස් හත්සිය හතලිස් අටක් (රු. 6,07,748) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි මස 01, අප්‍රේල් මස 01, ජූලි මස 01 සහ ඔක්තෝබර් මස 01 යන දිනවලදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනමක් මත පළකරනු ලැබූ බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය හා මෙහි පහත විස්තර කරන මෝටර් වාහන සමග විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්තිවලට අනුකූලව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2075 හා 2076 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ මෝටර් වාහන කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි. "

### අංක 2075 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 166 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දුටුවැව පරණගම ග්‍රාමයේ පිහිටි බිම් කට්ටියට මායිම්, උතුරට : දුටුවැව ප්‍රධාන පාරේ රිසවේසම, නැගෙනහිරට : එස්. අත්තනායකගේ ඉඩම, දකුණට : අඩි පාර රිසවේසම, බස්නාහිරට : ජේ. පියරත්නගේ ඉඩම යන මායිම් ඇතුළත අක්කර එකක් (අ. 1 රූ. 0 පර්. 0) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

මෑතකදී කරන ලද මැනීමකට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ :

උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ගලෙන්බිඳුණුවැව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උට්ටියන්කුලම කෝරළේ, දුටුවැව ග්‍රාමයේ පිහිටි දුටුවැවහේන නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු කේ. කේ. චින්නයියා විසින් මැන සාදන ලද අංක 373 හා 1999.02.04 දින දරන හා 2005.02.22 වැනි දින නැවත සළකුණු කරන ලද පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන, උතුරට : දුටුවැවට යන පාර ද, නැගෙනහිරට : එස්. රත්නායකට අයිති ඉඩම සහ ලොට් අංක 2, දකුණට : අඩිපාර, බස්නාහිරට : ජේ. පියරත්නට අයිති ඉඩම යන මායිම් ඇතුළත අක්කර එකක් (අ. 1, රූ. 0, පර්. 0) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

අංක 2076 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද වත්කම් විස්තරය :

| *හඳුනාගැනීමේ අංකය* | *විස්තරය වර්ගය, මෝස්තරය අශ්වබලය යනාදිය* | *වැසි අංකය* | *එන්ජින් අංකය* | *තබා තිබෙන ස්ථානය* |
|---|---|---|---|---|
| 251-4961 | වර්ගය-ඉසුසු මෝටර් වෑන් රථය | WFS 62 FV 7109906 | 4FG 1607247 | කැකිරාව පාර, ගලෙන්බිඳුණුවැව |

මෙයට අදාළ සියලු උපාංග සහ මෙවලම් ඇතුළත් ය.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.

04-677/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.